# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1991 අප්‍රේල් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැක.

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

[සහතිකය සටහන් කළේ 1991 අප්‍රේල් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 37/87

**1980 අංක 26 දරන ආහාර පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 26 දරන ආහාර පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1980 අංක 26 දරන පනතේ 2 වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල "නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදාහැරීම" යන වචන ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට "නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම වගන්තියේ පාර්ශ්ව සටහනේ "නිෂ්පාදනය, ආනයනය, විකිණීම සහ බෙදා හැරීම" යන වචන වෙනුවට "නිෂ්පාදනය, ආනයනය, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, ගබඩා කිරීම සහ බෙදාහැරීම" යන වචන ආදේශ කිරීමෙන්.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් ආහාරයක් විකිණීම සඳහා සනීපාරක්ෂාවට" යන වචන වෙනුවට, "යම් ආහාරයක් සනීපාරක්ෂාවට" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ලේබල් කිරීම, ඇසිරීම, පදම් කිරීම, සකස් කිරීම, විකිණීම හෝ ප්‍රචාරය කිරීම" යන වචන වෙනුවට "පදම් කිරීම, සකස් කිරීම, ඇසිරීම, ලේබල් කිරීම, විකිණීම, ගබඩා කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රචාරය කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;

2—ඩී 08435 (90/03)

(2) එම වගන්තියේ අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයට යම් ආහාරයකට ලේබල් කිරීම හෝ එම ආහාරය ප්‍රචාරය කිරීම, ප්‍රධාන ආහාර බලධරයා විසින් එම ආහාරය පිළිබඳ ලේබල් කරුට හෝ ප්‍රචාරය කරන්නාට කරුණු කියා පෑමේ අවස්ථාවක් සැලසීමෙන් පසුව, තහනම් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය "ප්‍රධාන ආහාර බලධරයාගේ හෝ තත් කාර්යය සඳහා ඔහු විසින්" යන වචන වෙනුවට "ප්‍රධාන ආහාර බලධරයාගේ හෝ තත් කාර්යය සඳහා එම බලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "බලපත්‍ර නිකුත් කරන බලධරයා" සහ "බලපත්‍ර නිකුත් කරනු ලැබ" යන වචන වෙනුවට පිළිවෙළින් "ලියාපදිංචි කරන බලධරයා" සහ "ලියාපදිංචි කරනු ලැබ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "බලපත්‍රයක්" සහ "බලපත්‍රයක" යන වචන වෙනුවට පිළිවෙළින් "ලියා පදිංචි කිරීමේ සහතිකයක්" සහ "ලියාපදිංචි කිරීමේ සහතිකයක" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම වගන්තියේ පාර්ශ්ව සටහනේ "බලපත්‍ර නිකුත් කිරීම" යන වචන වෙනුවට "ලියාපදිංචි කිරීම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයේ "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා" යන වචන වෙනුවට, "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයෙහි "සහකාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා" යන වචන වෙනුවට "අධ්‍යක්ෂ (පාරිසරික සහ වෘත්තීය සෞඛ්‍යය)" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "කොළඹ මහා නාගරිකයේ නාගරික රස පරීක්ෂකවරයා" යන වචන වෙනුවට, "කොළඹ මහා නාගරිකයේ නාගරික රස පරීක්ෂකවරයා හෝ සහකාර නාගරික රස පරීක්ෂකවරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම උපවගන්තියේ (ඌ) ඡේදයේ "ලංකා ප්‍රමිති කාර්යාංශයේ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) එම උපවගන්තියේ (ඔ) ඡේදයේ "අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන්නා වූ ද එක් තැනැත්තෙකු බැක්ටීරිවේදියකු විය යුතු වූ ද" යන වචන ආදේශ කිරීමෙන්.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) එම උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) මහා නාගරිකයක පරිපාලන ප්‍රදේශය සඳහා (1) වන උප වගන්තිය යටතේ වූ ආහාර බලධරයා—

(i) එම ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද මහ නගර සභාව වන්නේ ය ; නැතහොත්

(ii) මහ නගර සභාවට ආහාර බලධරයා වශයෙන් ස්වකීය කාර්ය ඉටු කළ නොහැකි වන අවස්ථාවක, එම ප්‍රදේශය සඳහා වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වන්නේ ය ;

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "ඒ ප්‍රදේශය සඳහා වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාය" යන වචන වෙනුවට "ඒ ප්‍රදේශය සඳහා වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ කොට්ඨාශ සෞඛ්‍ය නිලධරයාය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "සෑම සෞඛ්‍ය සේවා අධිකාරීවරයකුම" යන වචන වෙනුවට "සෑම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයකුම" යන වචන ආදේශ කිරීමෙන්.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා" යන වචන වෙනුවට, "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3අ) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් හදිසි අවස්ථාවක දී, ප්‍රධාන ආහාර බලධරයා විසින්, මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග සියල්ලම හෝ ඉන් සමහක් ක්‍රියාත්මක කිරීම්

සම්බන්ධයෙන් අවශ්‍ය යැයි තමා සලකන විධාන, යම් බලයලත් නිලධරයකුට දෙනු ලැබිය හැකි අතර, එම බලයලත් නිලධරයා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකුගේ හෝ කොට්ඨාස සෞඛ්‍ය නිලධරයකුගේ සහාය ඇතිව ඒ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු, ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයෙකු" යන වචන වෙනුවට "යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු, කොට්ඨාස සෞඛ්‍ය නිලධරයකු, ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "ආහාර බලධරයකුගේ බලය ලත් නිලධරයකු වශයෙන්" යන වචන වෙනුවට "ආහාර බලධරයන් එක් කෙනෙකුගේ හෝ වැඩි ගණනකගේ බලය ලත් නිලධරයකු වශයෙන්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) "අසුරන හෝ ගබඩා කර තබන බවට" යන වචන වෙනුවට, "අසුරන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ ගබඩා කර තබන බවට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ "සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු" යන වචන වෙනුවට, "සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු හෝ කොට්ඨාස සෞඛ්‍ය නිලධරයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) බලය ලත් නිලධරයකු විසින් (4) වන උපවගන්තිය යටතේ ලබාගන්නා තොරතුරු, මේ පනතේ කාර්ය පරිපාලනය හෝ මේ පනත බලාත්මක කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට හෝ අධිකරණයකට මිස, හෙළි නොකළ යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1), (2) සහ (3) වන උපවගන්තිවල "බලධරයා" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "බලයලත් නිලධරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4) (3) වන උපවගන්තියේ විධිවිධාන කවරක් වුවද (2) වන උපවගන්තිය යටතේ අධිකරණයේ තොරතුරක් සැපයීමෙන් පසු කවර හෝ අවස්ථාවක, තහනමට ගනු ලැබුවා වූ ද ඉක්මණින් හා ස්වභාවිකව නරක්වීමට භාජන වන්නා වූ ද යම් භාණ්ඩයක් මහේස්ත්‍රාත්වරයා සුදුසුයැයි අදහස් කරන ආකාරයකට බැහැර කරන ලෙස මහේස්ත්‍රාත්වරයා විසින් විධාන කළ හැකි ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "යුතුය" යන වචනය වෙනුවට "හැකිය" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "අදාළ ආහාර බලධරයාට" යන වචන වෙනුවට "බලයලත් නිලධරයාට" යන වචන ආදේශ කිරීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "අතිරේක අනුමත රස පරීක්ෂකවරයකු" යන වචන වෙනුවට "අතිරේක අනුමත රස පරීක්ෂකවරයකු හෝ අතිරේක අනුමත රස පරීක්ෂකවරුන් වැඩි දෙනකු හෝ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් දහසකට නො අඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයක්" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට නො අඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයක්" යන වචන ආදේශ කිරීමෙන් :

(ආ) එම උපවගන්තියේ (ආ) ඡේදයේ "රුපියල් පන්සියයකට නො අඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයක්" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ (i) වන අනුඡේදයේ "රුපියල් දෙසිය පනහකට නො අඩු සහ රුපියල් පන්සියයකට නොවැඩි දඩයක්" යන වචන වෙනුවට "රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් තුන් දහසකට නොවැඩි දඩයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයක්" යන වචන වෙනුවට "රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ—

(අ) "තැනැත්තාට නිකුත් කරන ලද යම් බලපත්‍රයක් වේ නම්" යන වචන වෙනුවට "තැනැත්තාට නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමේ සහතිකයක් වේ නම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "අදාළ බලපත්‍ර නිකුත් කරන බලධරයාට" යන වචන වෙනුවට "අදාළ බලපත්‍ර නිකුත් කිරීමේ හෝ ලියා පදිංචි කිරීමේ බලධරයාට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන්—

"(3) (අ) යම් ස්ථානයක් සම්බන්ධයෙන් මේ පනතේ 7(1) වන වගන්තියට අනුකූලව පළමුකොට ලියා පදිංචි කිරීමේ සහතිකයක් ලබා නොගෙන එම ස්ථානය භාවිතා කිරීමේ වරදට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු, එම වරදකරු කිරීම නොතකා ඔහු විසින් ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු මගින්, එම ස්ථානය නොකඩවා භාවිත කරගෙන යන අවස්ථාවක, වසා දැමීමේ ආඥාවක් සඳහා අදාළ ආහාර බලධරයා විසින් හෝ ඒ ආහාර බලධරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත, එම ස්ථානය සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් එම ආහාර බලධරයාගෙන් ලියා පදිංචි කිරීමේ සහතිකයක් ලබාගන්නා තෙක්, එම ස්ථානය වසා දැමීමට හෝ එහි කරගෙන යන කර්මාන්තය හෝ ව්‍යාපාරය නතර කිරීමට හෝ මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කළ හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් යම් නඩු කටයුත්තක දී ආහාර බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ අත්සන් කරන ලද යම් සහතිකයක, ඒ සහතිකයේ සඳහන් තැනැත්තා, මේ පනතේ 7(1) වන වගන්තියට අනුකූලව එම ස්ථානය සම්බන්ධයෙන් ලියා පදිංචි කිරීමේ සහතිකයක් තලින් ලබා නොගෙන එම ස්ථානය නොකඩවා භාවිත කරන බව ප්‍රකාශ කෙරේද ඒ සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් විය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හැර ඇති අවස්ථාවක මහේස්ත්‍රාත්වරයා විසින් ඒ අධිකරණයේ පිස්කල්වරයාට නොපමාව ආඥාවක් නිකුත් කළ යුතු අතර එම ආඥාව එය

නිකුත් කරන දින සිට දින තුනකට වඩා කලින් නොවිය යුතු වූ ද දින හතකට වඩා පසුව නොවිය යුතු වූ ද එම ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එම ස්ථානය වසා දැමීමට හෝ එහි කරගෙන යනු ලබන කර්මාන්තය හෝ ව්‍යාපාරය නතර කිරීමට හෝ එම පිස්කල්වරයාට නියම කෙරෙන සහ බලය දෙන ආඥාවක් විය යුතුය. ඒ ආඥාව එම ස්ථානය වසා දැමීම සහ එම ස්ථානයේ කරගෙන යනු ලබන කර්මාන්තය හෝ ව්‍යාපාරය නතර කිරීම සඳහා අවශ්‍යයයි පිස්කල්වරයා අදහස් කරන තැනැත්තන් සමග එම ස්ථානයට ඇතුළු වීමට පිස්කල්වරයාට ප්‍රමාණවත් බලයදීමක් වශයෙන් ක්‍රියාත්මක විය යුතුය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) එම වරද අල්ලාගත් දිනයේ සිට හෝ සැම්පල් ගැනීම කරන අවස්ථාවක නම්, සැම්පල් ගැනීමේ දිනයේ සිට මාස තුනක කාල පරිච්ඡේදයක් ඉකුත්වීමෙන් පසුව හෝ නොකළ යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "වරදකට චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව ඇති චෝදනාව අස්කරගෙන" යන වචන ඉවත් කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "තමාගේ අදහස පිළිබඳව චෝදක පක්ෂයට දවස් තුනකට නොඅඩු කාලයකට පෙර දැන්වීමක් කිරීමෙන් පසුව ද" යන වචන වෙනුවට "සිතාසි භාරදීමෙන් පසුව නඩුව අඩගසන පළමුවන දිනයේ දී හෝ ඉන් පෙර, තමාගේ අදහස පිළිබඳව චෝදක පක්ෂයට දැන්වීමක් කිරීමෙන් පසුව ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.)

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ඔහු කැඳවීමේ වියදම එම පාර්ශ්වකරු විසින් අධිකරණයට ගෙවූ පසු" යන වචන වෙනුවට "ඔහුට ගෙවිය යුතු යයි නියම කරනු ලබන ගාස්තු ඇතුළුව ඔහු කැඳවීමේ වියදම එම පාර්ශ්වකරු විසින් අධිකරණයේ තැන්පත් කළ පසු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.)

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "නඩු පවරන වේලාවේ දී" යන වචන වෙනුවට "විභාගය ආරම්භ වන වේලාවේදී" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.)

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ "ප්‍රදර්ශනය කරනු හෝ තබාගනු ලැබුවහොත්" යන වචන වෙනුවට "ප්‍රදර්ශනය කරනු, තබාගනු හෝ ගබඩා කරනු ලැබුවහොත්" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මේ පනත යටතේ පළාත් පාලන ආයතනයක අරමුදලට හෝ ඒ අරමුදලින් සෝ මුදල් ගෙවීම.

29. (1) (අ) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන්, පළාත් පාලන ආයතනයක් වන ආහාර බලධර යකුගේ බලයලත් නිලධරයකු විසින් පවරනු ලද නඩුවක දී ගෙවන ලද හෝ අයකර ගන්නා ලද දඩ මුදල් එම පළාත් පාලන ආයතනයේ අරමුදලට ගෙවිය යුතු ය.

(ආ) මේ පනතේ කාර්ය පරිපාලනයේ දී පළාත් පාලන ආයතනයක් විසින් දරන ලද සියලු වියදම් එම පළාත් පාලන ආයතනයේ අරමුදලින් ගෙවිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වරදකරු කරන අධිකරණයක් විසින් ඒ වරද සම්බන්ධයෙන් නියම කරනු ලබන යම් දඩයකට අදාලව, අයකරගනු ලබන දඩයෙන් සියයට විසි පහක් නො ඉක්මවන මුදල් ප්‍රමාණයක් එම වරදකරු කිරීමට උත්සුක වූ බලයලත් නිලධරයාට ප්‍රදානය කළ යුතු බවට විධාන කිරීම නිත්‍යානුකූල විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "සෞඛ්‍ය සේවා අධිකාරිවරයාට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට" යන වචන වෙනුවට "ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට හෝ කොට්ඨාස සෞඛ්‍ය නිලධරයාට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඒ) ඡේදයේ (i) සහ (ii) යන අනුඡේදවල "බල පත්‍ර" යන වචනය වෙනුවට "ලියාපදිංචි කිරීමේ සහතික පත්‍ර" යන වචන ද, එම ඡේදයේ (iii) වන අනුඡේදයේ "බලපත්‍රයක්" යන වචනය වෙනුවට "ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රයක්" යන වචන ද ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සංවර්ධන සභාවක් හෝ ප්‍රාදේශිය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.